**රත්මලාන/ මොරටුව අපජල අපහරණ පියවර 01 අදියර 02 ව්‍යාපෘතිය - 2021**

---

රත්මලාන / මොරටුව අපහරණ පියවර 01 අදියර 02 ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන ආයතනය (Agence Francaise De Development) අතර 2019 පෙබරවාරි 18 දින එළඹි අංක සීඑල්කේ 1023 – 01 එල් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (ජේ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රත්මලාන නේවාසිකයන් (පදිංචිකරුවන් 95,000) සහ මොරටුව නේවාසිකයන් (පදිංචිකරුවන් 167,000 ක් ) සඳහා මලාපවහන සේවා ප්‍රවේශය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,682.36 කට සමාන යූරෝ මිලියන 105.5 ක් වන අතර ඉන් රු.මිලියන 15,414 කට සමාන යූරෝ මිලියන 75 ක් ණයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ප්‍රංශ සංවර්ධන ආයතනය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 6,268.36 කට සමාන යූරෝ මිලියන 30.5 ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 දෙසැම්බර් වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මතය**

---

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 **මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2** **භෞතික කාර්ය සාධනය**

**2.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| කාර්යයන් | 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | අපේක්ෂිත | සත්‍ය | | |
| (අ) නව පොම්පාගාර ඉදිකිරීම සහ පවත්නා පොම්පාගාර සහ අපජල කළමනාකරණ පිරියත වැඩිදියුණු කිරීම. | කොන්ත්‍රාත්තුවේ මූල්‍ය ඇගයීම 2021 දෙසැම්බර් අවසානයේ සිදු කිරීමට සැලසුම් කර තිබුණි. | මූල්‍ය ඇගයීම 2022 මැයි 15 දින වන තෙක් සිදු කර නොතිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ ලියවිලි ඇගයීම් වාර්තාව ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සඳහා ජල සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙත 2022 අප්‍රේල් මස යොමු කරන ලදී. වර්තමාන දේශපාලන අස්ථාවරත්වය නිසා ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව නැවත පත් කරන ලදී. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) ඉදිකිරීම් සහ අධීක්ෂණ උපදේශන | කොන්ත්‍රාත්තුව 2021 වර්ෂයේ හතරවන කාර්තුවේ ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. | 2022 මැයි 15 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර නොතිබුණි. | කොරෝනා වසංගතය සහ යෝජනා කැඳවීම පිළිබඳව AFD මත විමසුම ලබා ගැනීමෙන් පසු ඒ සඳහා ඔවුන්ගේ විරුද්ධත්වයක් නොමැති බවට තහවුරුවක් ලබාගැනීම ප්‍රමාදයට හේතු විය. ප්‍රධාන කොන්ත්‍රාත් කාර්යය මෙතෙක් ආරම්භ කර නොමැති නිසා මෙහි ප්‍රමාදය ප්‍රගතිය කෙරෙහි බල නොපායි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) ගෘහස්ථ සබඳතා ලබා දීම. | කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛන 2021 වර්ෂයේ දෙවැනි කාර්තුවේ පිළියෙල කිරීමට සැලසුම් කර ඇත. | 2022 මැයි 15 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛන පිළියෙල කර නොමැත. | ගෘහස්ත සබඳතා ලබා දීමේ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම පොම්පාගාර ඉදිකිරීම් හා ජාලගතකිරීම් සම්පූර්ණ කල යුතුය. ඉදි කිරීම් කාර්ය කෙරීගෙන යන අතරතුර ලංසු ලේඛන පිළියෙල කළ හැක. එම නිසා, ව්‍යාපෘති අරමුණ කෙරෙහි අහිතකර ලෙස බල නොපායි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ අධීක්ෂණ උපදේශන කොන්ත්‍රාත්තුව, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමට පෙර ප්‍රදානය කළ යුතු වුවද, එය 2022 මැයි 15 වන විටත් ප්‍රදානය කර නොතිබුණි. | වර්තමානයේ පයිප්ප එලීම් කොන්ත්‍රාත්තුව යටතේ සවලීකරණ කාර්යය සහ වැඩබිම් විමර්ෂණය කෙරෙමින් පවතී. අධීක්ෂණ උපදේශන කොන්ත්‍රාත්තුව අත්‍යවශ්‍ය වන්නේ ප්‍රධාන කොන්ත්‍රාත් කාර්යය කිරීමේදී ය. එම නිසා, මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රගතියට උපදේශන කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදය බල නොපායි. | උපදේශන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම කඩිනම් කළ යුතුය. |

**2.3 සම්පත් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ණය ගිවිසුම් අත්සන් කළ දින සිට අවුරුදු 02 ක් සහ මාස 10 ක් යන තෙක් ණය මුදල උපයෝජනය කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබූ බව අනාවරණය විය. එම නිසා, ණය නියෝජිතායතනය විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය නොකළ ණය ශේෂය මත බැදීම් ගාස්තු ලෙස රු.මිලියන 205.09 ක් අය කර තිබුණි. | පොම්පාගාරය ඉදිකිරීම සඳහා තෝරාගන්නා ලද තාක්ෂණික හා මූල්‍යමය අතින් වඩා යෝග්‍ය ඉඩමට මහජන විරෝධය පැමිණීම නිසා එය කිහිප වාරයක් වෙනස් කිරීමට සිදු විය. මෙම හේතුව නිසා මුල් සැලැස්ම, BOQ ප්‍රමාණයන්, අඳින ලද සටහන් ඒ අනුව සංශෝධනය කිරීමට සිදු විය. සැලසුම් හා ලංසු ලේඛන නිම කිරීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම ප්‍රමාදයන් ව්‍යාපෘති පරිපාලනයෙන් බැහැරය. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාර්යය කඩිනම් කිරීමට NWSDB ක්‍රියා කළ යුතුය. |

## 2.4 පද්ධතිය සහ පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2010 ජුලි 26 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 5 ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශය ඔවුන්ගේ විමර්ශන සිදු කරයි. නමුත් මෙතෙක් වාර්තා ඉදිරිපත් නොකල අතර කඩිනමින් එම වාර්තා ඉදිරිපත් කරන බව ඔවුන් දැනුම් දී ඇත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනය කර නොතිබුණි. | පසුගිය වර්ෂය සඳහා ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනයක් සිදු නොකළ අතර මෙම වර්ෂයේ ඒ සඳහා කටයුතු සූදානම් කරයි. | ස්ථාවර වත්කම් භෞතික සමීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |